## තෙත්බිම් සංරක්ෂණය කළ යුත්තේ ඇයි?

තෙත්බිම් වනාහි ඉතා ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත වූද, ජල විද්‍යාත්මක වශයෙන් වටිනාකමකින් යුක්ත වූද, ඉතාම සංවේදී පාරිසරික කලාපයකි. විශේෂයෙන් ම ජලවර පක්ෂි වාසභූමි ලෙස ජාත්‍යන්තර වැදගත්කමකින් යුක්ත වූ තෙත්බිම් පිළිබඳ සම්මුතිය (RAMSAR) තෙත්බිම් අර්ථකතනය කරනුයේ මෙසේය. "වගුරු ප්‍රදේශ, ගොහොරු ජලයෙන් පිරිගිය ගස්බෙන සහිත ප්‍රදේශ, ස්වභාවිකව හෝ තාවකාලිකව, නිශ්චලව හෝ ස්ථිරව ජලය රැඳී තිබෙන හෝ ගලා යන මිරිදිය කිවුල්දිය හෝ ලවණ සහිත හෝ කරදිය සහිත ප්‍රදේශද ඇතුලත් වන්නා වූ බාදිය අවස්ථාවේ දී ගැඹුර මීටර් හයක් නො ඉක්මවන්නා වූ ප්‍රදේශ තෙත්බිම් වේ" යනුවෙනි. දැනට ගණන් බලා ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ සමස්ත භූමියෙන් 15%ක් පමණ තෙත්බිම් වශයෙන් හඳුනාගෙන ඇති අතර මේවායින් බොහොමයක් දේශීය වශයෙන් මෙන්ම ජගත් වටිනාකමකින්ද යුක්ත වන බව සොයාගෙන ඇත.

තෙත්බිම් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන අංශ තුනක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම් ස්වභාවික අභ්‍යන්තර තෙත්බිම්, වෙරළබඩ තෙත්බිම් සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද තෙත්බිම් යනුවෙනි.

ස්වභාවික අභ්‍යන්තර තෙත්බිම් පිළිබඳව සැලකීමේදී ගංගා, ඇළ දොළ, පිටාර තැනි, හුදකලා මිරිදිය ජලාශ, මිරිදිය උල්පත් ආදී වූ පරිසර පද්ධති මේ ගණයෙහිලා සැලකිය හැකිය. ස්වභාවික වර්ෂාපතන ක්‍රියාවලිය තුළින් මෙම තෙත්බිම් වලට ජලය සැපයෙයි. මධ්‍යම කඳුකරයෙන් පටන්ගෙන දිවයිනේ විවිධ ප්‍රදේශ පසුකරමින් සාගරය හා එක්වන 103 ක් පමණ වූ ගංගාවන් ශ්‍රී ලංකාවේ ස්වභාවික අභ්‍යන්තර තෙත්බිම් නිර්මාණය කිරීමෙහි ලා සුවිශේෂී කාර්යයක් සිදු කරයි. මේවා මගින් පිටාර තැනි වලට සහ වාරි ජලාශ වලට ජලය සැපයේ. ජෛව විවිධත්වයෙහි ලා ඉතා වැදගත් වන විශාල ගොහොරු සහ වගුරු බිම් ගංගා ආශ්‍රිතව නිර්මාණය වේ.

වෙරළබඩ තෙත්බිම් සමන්විත වනුයේ ඩෙල්ටා, වගුරුබිම්, කලපු, ගං මෝය, ලවණ ගොහොරු, වෙරළබඩ මුහුදු තණබිම් ආදී වූ පාරිසරික පද්ධති වලිනි. මේවායේ අර්ධ වශයෙන් ලවණීකරණය වූ හෝ මුළුමනින්ම ලවණීකරණය වූ ජලය පවතී. මෙවන් වූ තෙත්බිම් ආශ්‍රිතව එම කලාපවල පවතින පාරිසරික සාධක වලට අනුවර්තනය වූ විශේෂිත ශාක හා සත්ව විශේෂ දැක ගත හැකිය. විශේෂයෙන්ම කඩොලාන ශාක මෙවන් වූ පරිසර පද්ධති වල දැකගත හැකි වන අතර සංචාරක පක්ෂීන්ගෙන් මෙවන් පරිසර පද්ධති පොහොසත් වේ.

මිනිසා විසින් නිර්මාණය කරන ලද තෙත්බිම් පිළිබඳව සැලකීමේදී වාරි කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය කරන ලද වැව්, අමුණු, වාරි මාර්ග පද්ධති, කෘෂිකාර්මික බිම්, ජලජීවී පොකුණු ආදිය මේ ගණයෙහි ලා සැලකිය හැකිය. අතීත ශ්‍රී ලංකාවේ විසූ රජවරුන් විසින් නිර්මාණය කරන ලද දස දහසකට අධික වූ වැව් හෙක්ටයාර ලක්ෂ පහක් පමණ වූ බිම් ප්‍රමාණයකට කෘෂිකර්මාන්තය සඳහා ජලය සැපයීම මිනිසා විසින් නිර්මාණය කරන ලද තෙත් බිම් වලට කදිම උදාහරණයකි.

මේ කිනම් ස්වරූපයකින් දක්නට ලැබුණද මිනිසා ඇතුළු සත්ත්ව හා ශාක ප්‍රජාව තෙත්බිම් මත යැපෙමින් ඒවා ස්වකීය අවශ්‍යතා සපුරා ගන්නා මාධ්‍ය වශයෙන් භාවිතා කිරීම රහසක් නොවේ.

තෙත්බිම් මගින් ජනතාවගේ පැවැත්මට සෘජු හා වක්‍ර ආකාරයෙන් බලපාන පාරිසරික කාර්යයන් රැසක් සිදු වේ. එහිදී ධාරානිපාත වැසි වලින් පසුව ඇතිවන ගංවතුර තත්ත්වයන් මැඩ පැවැත්වීම සඳහා තෙත්බිම් කටයුතු කිරීම විශේෂ කාර්යයකි. තෙත්බිම් සතුව පවතින ජලය ගබඩා කර ගැනීමේ හැකියාව නිසා ක්ෂණිකව ඇති වන ගං වතුර තත්වයන් ඒ මගින් පාලනය කෙරේ. මේ නිසා ගං වතුර තර්ජනයකදී ඇති වන විනාශය අවම කර ගැනීමේ හැකියාව තෙත් බිම් සතු වේ.

විශේෂයෙන්ම වෙරළබඩ තෙත්බිම් ආශ්‍රිතව දක්නට ලැබෙන කඩොලාන ශාක සමුද්‍ර ඛාදනයෙන් වෙරළ තීරය ආරක්ෂා කරයි. වෙරළ ආශ්‍රිත කලාපයේදී මෙම ශාක සුළං කඩනයක් ලෙසින් ක්‍රියා කර වෙරළ තීරය ආරක්ෂා කරන අතරම මෙමගින් උදම් රළවල ප්‍රවේගය ද අඩු කෙරේ.

කඩොලාන ශාක වනාහි අර්ධ වශයෙන් ලවණීකරණය වූ ජලයෙහි සෑදෙන කුඩා පැළෑටිවල සිට පඳුරු සහ උස ගස් දක්වා වෙනස් වන පරිසරයට අනුව අනුවර්තනය වන්නා වූ ශාක විශේෂයකි. කලපු, ගං මෝය හා වෙරළබඩ කලාප වල වැඩි වශයෙන් දැක ගත හැකි මෙම ශාක විශේෂය මගින් මිනිසාට සැලසෙන වෙනත් වාසි කිහිපයකි. මෙම ශාක වෙරළ තීරය සංරක්ෂණය කරනවා සේම ධීවර කර්මාන්තයේදී ද කඩොලාන ශාකවල පිහිටීම වැදගත් වේ. මක් නිසාද යත් මෙම ශාක ආශ්‍රිත කලාපවල මසුන්ට අවශ්‍ය ආහාර සහ ප්‍රජනනයට සුදුසු වාසස්ථාන සැකසී ඇති බැවින් මෙම කලාප වල මසුන් බහුලව ගැවසෙනු දක්නට ලැබෙන හෙයිනි. මේ නිසා ධීවර කර්මාන්තයේ වර්ධනයක් කඩොලාන ශාක ආශ්‍රිත වෙරළබඩ තෙත්බිම්හි දැක ගත හැකිය.



එසේම කඩොලාන ශාක මගින් වායු ගෝලීය කාබන්ඩයොක්සයිඩ් උරා ගනිමින් ගෝලීය උණුසුම්කරණය තුළනය කිරීමද සිදු වේ. එපමණක් ද නොව කඩොලාන ශාක මගින් එම පාරිසරික කලාපය තුළ ජීවත් වන මිනිසාගේ ගෘහාශ්‍රිත ඉන්ධන අවශ්‍යතාව සපිරීමද විශේෂ කාර්යයකි. මේ කලාපයේ ජීවත් වන මිනිසා දර සහ දැව ලබා ගැනීමේදී කඩොලාන ශාක උපයෝගී කොට ගනී. තවද ඇතැම් කඩොලාන ශාක වර්ග එළවළු සහ පළතුරු වශයෙන් භාවිතා කිරීමද දක්නට ලැබේ. උදාහරණ වශයෙන් කැරන්කොකු,

කිරල, වැනි ශාක දැක්විය හැකිය. එසේම කඩොලාන ආශ්‍රිත පරිසර පද්ධතිවල ජීවත් වන මත්ස්‍ය, උරග, උභයජීවී හා පක්ෂි යන සත්ව කොට්ඨාශයන්ටද මෙම කලාපයන් තුළ ආහාර පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව ඇති නිසා මෙහි විශාල ජෛව විවිධත්වයකට වාසස්ථාන සැපයෙනු දක්නට ලැබේ.

දියුණු වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ ජීවත් වන ජනතාවගේ සමස්ත ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් සපුරාලීමට මිරිදිය ධීවර කර්මාන්තය සහ කිවුල් දිය ධීවර කර්මාන්තයට හැකියාව ලැබීම තෙත්බිම්වලින් අපට සැලසෙන තවත් ප්‍රයෝජනයකි. එසේම ග්‍රාමීය ආර්ථිකයේ දක්නට ලැබෙන විරැකියා ප්‍රශ්නයට මිරිදිය හා කිවුල්දිය ධීවර කර්මාන්තය විශාල පිටුවහලක් වනු ඇත.

දියුණු වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ ජීවත් වන ජනතාවගේ සමස්ත ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් සපුරාලීමට මිරිදිය ධීවර කර්මාන්තය සහ කිවුල් දිය ධීවර කර්මාන්තයට හැකියාව ලැබීම තෙත්බිම්වලින් අපට සැලසෙන තවත් ප්‍රයෝජනයකි. එසේම ග්‍රාමීය ආර්ථිකයේ දක්නට ලැබෙන විරැකියා ප්‍රශ්නයට මිරිදිය හා කිවුල්දිය ධීවර කර්මාන්තය විශාල පිටුවහලක් වනු ඇත.

තෙත්බිම් වනාහී ඉතා ඉහළ ජෛව විවිධත්වයකින් යුතු පාරිසරික කලාපයකි .මෙහි ශාක විවිධත්වය ගංගාවන් ආරම්භ වන උස් බිම්වලදී වේගයෙන් ගලා යන ජල ප්‍රවාහයන්ට ඔරොත්තු දීමේ හැකියාව මත පදනම් වූ තනි තනිව පිහිටි සරල ජල ශාක ප්‍රජාවන්ගෙන් සමන්විත වන අතර එය පහත් බිම්හි දිය පහර වලදී හා නොගැඹුරු වැව් පොකුණුවල මතුපිට පාවෙන ජලජ ශාක විශාල ප්‍රමාණයක් දක්වා වෙනස් වේ. ඕලු, නෙළුම්, මානෙල්, කෙකටිය ආදී වූ මෙබඳු ජලජ ශාකවලවල පුෂ්ප ආගමික කටයුතු සඳහා බහුල වශයෙන් උපයෝගී කොටගනු දක්නට ලැබේ. එමගින් ග්‍රාමීය ආර්ථිකයට සුවිශේෂ දායකත්වයක් ලැබෙන බවද කිව යුතුය. ගං ඉවුරු අසබඩ දක්නට ලැබෙන කුඹුක්, මී වැනි ශාක සමගින් දක්නට ලැබෙන පටු වනාන්තර තීරු තෙත්බිම් ආශ්‍රිත ශාක විවිධත්වය වැඩි කරන අතරම මේවා ඝන අරටුවකින් යුතු ඉතා වටිනා දැව වර්ග බවද සඳහන් කළ යුතුය. විවිධ



වර්ගයේ කඩොලාන සුවිශේෂී තෙත්බිම් කලාපයන්ට පමණක් සීමා වන අතර මේවා ජෛව විවිධත්වයෙහි ලා සුවිශේෂී වන ශාක වර්ග ලෙස හඳුන්වා දිය හැකිය. සත්ත්ව විවිධත්වය අතින් බැලූවද තෙත්බිම්වල ඉතා ඉහළ විවිධත්වයක් පවතී. විශේෂයෙන්ම මත්ස්‍ය, උරග, උභයජීවී හා ජලචර පක්ෂීන්ගෙන් තෙත්බිම් සමන්විත වේ. තෙත් කලාපයේ වනාන්තර වලින් ආරම්භ වන ගංගා ඇළ දොළ වල ආවේණික මත්ස්‍ය විශේෂ සියල්ලටම පාහේ වාස භූමි සපයයි. දුම්බර කඳුවැටිය ආශ්‍රිත දිය කඩිති වල ශ්‍රී ලංකාවේ වාසය කරන මිරිදිය මසුන් අතරින් විශේෂ 28 ක් පමණ හඳුනාගෙන තිබෙන අතර ඉන් විශේෂ 09ක්ම වඳ වී ගෙන යාමේ තර්ජනයට ලක් වූ හා ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂයන් වීම වැදගත් කරුණකි. එසේම හෝර්ටන්තැන්න වැනි කඳුකර ප්‍රදේශවල තෙත් පතන් බිම්වල ආවේණික මිරිදිය මත්ස්‍යයන් සහ දිය කඩිති ජීවීන් විශාල ප්‍රමාණයක් දැකගත හැකිය.

එසේම වියළි කලාපයේ වැව් ආශ්‍රිතව එම කලාපයට පමණක් සීමා වන මත්ස්‍ය විශේෂයන් දැක ගත හැකි අතර වෙරළ ආශ්‍රිතව ඉස්සා, පොකිරිස්සා, කකුළුවා වැනි ජීවීන් දැක ගත හැකිය.

එසේම ස්වභාවික අභ්‍යන්තර තෙත්බිම් ආශ්‍රිතව ශ්‍රී ලංකාවට ආවේණික හා වඳ වී ගෙන යාමේ තර්ජනයට ලක් වී සිටින ගල්පර මැඩියා, ආදී වූ උභය ජීවී විශේෂ දැක ගත හැකිය. ශ්‍රී ලංකාවේ එකම රැම්සා පරිශ්‍රය වන බුන්දල වැනි වෙරළබඩ තෙත්බිම් මෙරටට පැමිණෙන සංචාරක පක්ෂීන් විශාල පිරිසකට වාස භූමි සපයයි. සංචාරක කුරුළු වාරයේදී පිටරටින් පැමිණෙන කුරුල්ලන් වර්ග 149 ක් පමණ මෙහි දිවි ගෙවන බව වාර්තා වේ. තවද දර්ලභ ගණයේ කැස්බෑවන් විශාල වශයෙන් බිත්තර දැමීමට පැමිණෙන ස්ථානයක් වශයෙන්ද බුන්දල වැදගත් වේ. ඒ මතුදු නොව මෙවන් වනරොදවල ගොඩබිම වසන විශාලතම උරගයා වන කිඹුලා ඇතුළු බොහෝ උරගයින්ද විවිධ වර්ගයේ උභය ජීවීන්ද ඇතුළු ලොකු කුඩා ජීවීන් රැසක්ම වාසය කරයි. මේ තෙත්බිම්වල පවතින ආහාර සුලබතාවය හා පක්ෂීන්ට සුදුසු වාසස්ථාන පවතින නිසා නිරන්තරයෙන් ම සංචාරක පක්ෂීන් මේ කලාපවලට වර්ෂයේ විවිධ කාලවලදී සංක්‍රමණය වේ.

ශීඝ්‍ර නාගරීකරණ හා කාර්මීකරණ ක්‍රියාවලියකට භාජනය වී ඇති කොළඹ නගරය ආශ්‍රිත පිටාර තැනි බිමක් ලෙස ගංවතුර පාලනය කරන මාධ්‍යයක් වශයෙන් සේම කාර්මික අපද්‍රව්‍ය බැහැර කරන මාධ්‍යයක් වශයෙන් ද බෙල්ලන්විල අත්තිඩිය අභයභූමිය වැදගත් වේ. දිවයිනේ බොහොමයක් තෙත්බිම් අද දවස වන විට කැළි කසල බැහැර ලන මාධ්‍යයක් වශයෙන් යොදා ගනු දක්නට ලැබේ.නමුත් පරිසර හිතකාමී ජනතාවක් වශයෙන් අප විසින් සිදු කළ යුතු වන්නේ ආර්ථික, සාමාජීයය, විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක අගයෙන් පිරුණු තෙත්බිම් සංරක්ෂණය කිරීම බව පිළිගත යුතු සත්‍යයකි.



ජේ.පී.ශාන්ති
ප්‍රචාරක නිලධාරී
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.